# 19 වන දවස

## ඔබවහන්සේගේ කැමැත්ත ඉටුවේවා !
## ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද එසේ ම වේවා !

දෙවිඳුන් මිනිසාට පමණක් දුන් (අන් කිසිම මැවිල්ලකට නොදුන්) ලොකුම තිළිණය නිදහස් කැමැත්තෙන් තීරණ ගැනීමේ හැකියාවයි. ඒ අන් කිසිවකට නොව නිදහසින් දෙවිඳුන්ට කීකරු වීමටයි. දේව කැමැත්ත ඉටු කිරීමටයි. සිදුවූයේ දෙවිඳුන්ට සවන් දීම වෙනුවට නපුරාට සවන් දීමයි. වැරදි තැනකට සවන් දීමයි. නිදහස භුක්ති විඳීමට ලැබුණු නිදහස් කැමැත්ත නිදහසින් වහල්කම තෝරා ගැනීමට මාර්ගය විවෘත කරවීමයි.

විශ්වය දේව සැලැස්ම කරා එසවීමට වහල්කම වැළඳ ගෙන ඊට යටවී සිටි මිනිසා ඉන් මුදා විමුක්තිය උදා කිරීමට ක්‍රිස්තුන් වහන්සේට විශාල මිලයක් වන්දියක් ගෙවීමට සිදුවිය. ඒ දෙවි පියාණන් වන්දියක් ඉල්ලූ නිසා නොව පාපයේ බර එතරම් දරුණු වූ නිසා එම බරෙන් මිනිසා මිදීමට මැදි වූ ක්‍රිස්තුන් වහන්සේට එම දරුණු බරට යටවී වන්දි ගෙවීමට සිදුවීමයි. පාපයේ භයානක ස්වරූපය ඇත්තේ එතනමයි. පාපය ගඟක් වගේ ගලමින් මිනිසාව ගස් කොළන් සහ සතා සිවුපාවා පවා දුකට වේදනාවට පත් කරයි. ක්‍රිස්තුන් වහන්සේ කළේ ඉන් අපව මුදා ගැනීමයි. අපට මිදීම ලැබී ඇත. එහෙත් පාපයේ ගලා යැම නැවැත්වීමට අප හැම කෙනෙකුම පව් නොකිරීමට තීරණයක් ගත යුතුව ඇත. දේව කැමැත්ත ඉටු කිරීම යනු එයයි. **''පියාණෙනි ඔබ කැමති සේක් නම් මේ කුසලානය මාගෙන් පහ කළ මැනවි. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබවහන්සේගේ කැමැත්ත වේවා! ඔවුන් වහන්සේ දැඩි සිත් වේදනාවෙන් පෙළුණු සේක. ඔවුන් වහන්සේගේ දහඩිය ලේ බිංදු මෙන් බිමට වැටිණි''** (ශු. ලූක් 22:42-44).

**දවස පුරා :-**
- ✵ ''මගෙ සිත බිඳිනට මම ඔබ අමතමි
  සමිඳුනි අසනු මැනේ''
- ✵ හෙබ්‍රෙව් 12:1-4
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 33